බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය . 2025
උපකාරක ප්‍රශ්න පත්‍රය

ශ්‍රේණිය: 11	විෂය: නාට්‍ය හා රංග කලාව	පත්‍රය: I	කාලය : පැය 01යි

සැලකිය යුතුයි.

- **සියලු ම ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (i) (ii) (iii) (iv) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

පහත දැක්වෙන කවි ගීත සංවාද ඇසුරෙන් අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A) සවන් දී පෙර රාම චරිතේ අසව් //

පොරණ ලක්දිව උන්නු රාවණ

ආල වී ජානකී ගෙන ගියේ තම රියේ ....

B) මං ලෙස සොබනා- ලොවේ වෙන

ඇද්දෝ අඟනා බලනු මගේ ....

C) නැද්ද සිතේ අනුකම්පා මේමා හට

නෑ මට මට අන් සරණා

වෙනූ කරුණා....

D) ඔන්න මම තේ වතුර වත් කරගෙන ආහම මේ මහත්තුරු එක්කෙනෙක්වත් නෑ. තේ බොන්ඩ මතක නැතිව ඇවිදින්ඩ යන්න ඇති. ඔහොම තමයි ඕගොල්ලන්ගේ හැටි....

E) a- මට යන්න බෑ ලොකු අත්තේ. ඇයි ලොකු අත්ත නිකන් බලාගෙන ඉන්නේ?

b- දරුවා කැමති නැත්නම් ඇයි උඹට වද කරන්නෙ?

(1) නවීකරණය හේතුකොටගෙන සාම්ප්‍රදායික උරුමයන් ගුණ දහම් විනාශ වී ගොස් සංස්කෘතික සෝදාපාලුවට ලක්වීම පිළිබඳව කියැවෙන නාට්‍යයක් හා සම්බන්ධ වනුයේ,

i) A ය. ii) C ය. iii) D ය. iv) E ය.

(2) ගැමි නාටක සම්ප්‍රදායක අභාශය ලබමින් නිර්මාණය වූ නාට්‍යයක් හා සම්බන්ධ වනුයේ,

i) A ය. ii) C ය. iii) D ය. iv) E ය.

(3) විශ්වනාත් ලාවිජි විසින් සංගීතය නිර්මාණය කරන ලද නාට්‍යයක් හා සම්බන්ධ වනුයේ,

i) A ය. ii) B ය. iii) C ය. iv) E ය.

(4) පහතරට ගැමි නාටකයක පූර්ව රංගයේ එන චරිතයක් හා සම්බන්ධ වනුයේ,

i) A ය. ii) B ය. iii) C ය. iv) E ය.

(5) භරත මුනිවරයාගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව "ගාත්‍රා වික්ෂේප මාත්‍රතුං සර්වාභිනය වර්ජිතමී...." ලෙස ප්‍රකාශ කර ඇත්තේ පහත සඳහන් කුමක් පිළිඹඳවද?

i) නෘත්ත ය. ii) නෘත්‍ය ය. iii) නාට්‍ය ය. iv) අභිනය ය.

අංක 6 සිට 9 දක්වා ප්‍රශ්න සඳහා පහත වගුව ඇසුරු කර ගනිමින් අදාළ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

A	B	C	D
වඩිග පටුන	කපුයක්කාරිය /දරුනැලවිල්ල	ගුරුගේ මාලාව/යක්කම්	සන්නි දහඅට
මැණික්පාල බිසව	රට යකුම	හාරිස්පත්තුව	අභිමාන/ රීරියකා
අණවින	දීපංකර බුදුන්	හැටපස් මංගල්‍යය	සන්නි යකුම

(6) පඬුවස්දේව් රජතුමාට වැළඳුන දිවි දෝෂය ඉවත් කිරීමට සිදු කරනු ලැබූ ශාන්ති කර්ම ය අයත් අක්ෂරය වන්නේ,

i) A ය. ii) B ය. iii) C ය. iv) D ය.

(7) නානුගෑම, නෑම, සළු පැළඳීම, හිස පීරීම, තෙල් ගෑම, ආදී ය ඇතුළත් වන **දොලහ පෙළපාලිය**, අයත් ශාන්ති කර්මයට අදාල අක්ෂරය වන්නේ,

i) A ය. ii) B ය. iii) C ය. iv) D ය.

(8) ඉහත C අක්ෂරයට අදාළ ශාන්ති කර්මය සඳහා වාදනය කරන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ,

i) දවුලය. ii) යක්බෙරය. iii) ගැට බෙරය ය. iv) තම්මැට්ටමය.


(9) අණවින, කොඩිවින හූනියම් හේතුවෙන් හටගන්නාවූ දරුණු රෝගාබාධ සඳහා කරනු ලබන ශාන්ති කර්මය වන්නේ,

i) කොහොඹා කංකාරිය. ii) සූනියම් යාගය. iii) රටයකුම. iv) දහඅට සන්නිය.

(10) ඇරිස්ටෝටල් විසින් රචනා කරන ලද නාට්‍ය සම්බන්ධ කෘතිය වන්නේ,

i) නාට්‍ය ශාස්ත්‍රය. ii) කාව්‍ය ශාස්ත්‍රය. iii) භගවත් ගීතාව. iv) නාට්‍ය ගවේෂණ.

(11) මෙම රූපයට අනුව B අක්ෂරයෙන් දැක්වෙන්නේ,



i) මල්මඩුව ය.

ii) වෙස් අත්ත ය.

iii) සබය ය.

iv) වේදිකාව ය.

(12) එහි B අක්ෂරයෙන් දැක්වෙන කොටසෙන් සිදුවන කාර්යය වන්නේ,

i) නළුවන් වේශනිරූපණය කිරීම.

ii) තමන්ගේ වාරය එන තුරු නළුවන් සැඟවී සිටීම.

iii) බුදුන්ට දෙවියන්ට මල් පහන් පූජා කිරීම.

iv) වාදන වෘන්දය ස්ථාන ගත කිරීම.

(13) "බෝසත් දැක්ම", "රජ දැක්ම", "පෝලිම", "රුකඩයෝ". මෙම නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,

i) සුගතපාල ද සිල්වා ය. ii) හෙන්රි ජයසේන ය.

iii) ගාමිණී හත්තොට්ටුවේගම ය. iv) ආර්. ආර්. සමරකෝන් ය.

(14) අනුවර්තන නාට්‍යයක් වන්නේ,

i) පුත්‍ර සමාගම. ii) කපුවා කපෝති. iii) ජනේලය. iv) හිරු නැති ලොව.

(15) අංග රචනා ද්‍රව්‍යය මුහුණින් ඉවත් කිරීම සඳහා භාවිත කළ යුතු ද්‍රව්‍ය වන්නේ,

i) ක්ලෙන්සර්. ii) බේබිඔයිල්. iii) ෆෙස් වොෂ්. iv) වෙට් ටිශූස්.

පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක 16 සිට අංක 19 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

නාට්‍යයේ නම	**රචකයාගේ නම**	**පරිවර්තනය/ අනුවර්තනය**	**මෙරට නිෂ්පාදක/ අනුවර්තක**
ඇපල් කාට්	**A**	ඇපල් කරත්තය	පියදාස නිශ්ශංක
ත්‍රී පෙනි ඔපෙරා	බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්	පැන්ස තුනේ කතාව	**B**
C	ටෙනිසි විලියම්ස්	වෙස් මුහුණු	ධම්ම ජාගොඩ
ඉර්මා ලාඩුෂ්	ඇලෙක්සැන්ඩර් බ්‍රෙෆොට්	**D**	සුගතපාල ද සිල්වා

(16) ඉහත වගුවේ A කොටුවට ඇතුලත් විය යුතු නාට්‍ය රචකයා කවුද?

i) ප්ලෝටස්. ii) බර්නාඩ් ෂෝ. iii) ඇන්ටන් චෙකෝව්. iv) මැක්සිම් ගෝර්කි.

(17) ඉහත වගුවේ B කොටුවට ඇතුළත් විය යුතු මෙරට නිෂ්පාදකගේ නම කුමක්ද?

i) සයිමන් නවගත්තේගම. ii) බන්දුල ජයවර්ධන.

iii) විජිත ගුණරත්න. iv) සුනිල් විජේසිරිවර්ධන.

(18) ඉහත වගුවේ C කොටුවට ඇතුළත් විය යුතු මුල් නාට්‍ය කෘතියේ නම කුමක්ද?



i) ද ලෝවර් ඩෙප්ත්ස්. ii) ද ඩැගන්.

iii) ද පබ්ලික් එනමි. iv) අ ස්ට්‍රීට් කාර් නේම්ඩ් ඩිසයර්.

(19) ඉහත වගුවේ D කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තිත නාට්‍යයේ නම කුමක්ද?

i) මුතු කුමාරි. ii) උත්තමාවී. iii) ලියතඹරා. iv) දේවතාඑළි.

පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් 20 සිට 23 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A	B	C	D	E
				

(20) 1963 රංගන ක්ෂේත්‍රයට පිවිස වේදිකාව සිනමාව රූපවාහිනිය සහ ගුවන් විදුලිය යන ක්ෂේත්‍රවල දක්ෂතා දැක්වුයේ,

i) A ය. ii) C ය. iii) D ය. iv) E ය.

(21) අභිරූපණයට මෙන්ම රංග භූමි අලංකරණය හා වෙස්ගැන්වීම් සඳහා දක්ෂතා දැක්වූයේ,

i) A ය. ii) B ය. iii) C ය. iv) E ය.

(22) රෝමය ගිනි ගනී, මී පුරවැසියෝ, මේඝ, යන නාට්‍ය සඳහා රංගනයෙන් දායක වූයේ,

i) B ය. ii) C ය. iii) D ය. iv) E ය.

(23) ආර්. ආර්. සමරකෝන්ගේ සුපුසිද්ධ නාට්‍යයක ප්‍රධාන චරිතයක් ඉදිරිපත් කරන ලදදේ,

i) A ය. ii) B ය. iii) E ය. iv) D ය.

(24) නාඩගම් නාට්‍යවල පූර්ව රංගයේදී පොතේගුරු විසින් පමණක් කෙරෙන ගායනයක් වන්නේ,

i) මංගලම් සින්දුව ය. ii) තර්ගය ය.
iii) පොතේ ඉන්නසිය ය. iv) තෝඩායම ය.

(25) විශ්ව විද්‍යාල සිංහල සමිතිය මඟින් රඟදැක් වූ නාට්‍ය ත්‍රිත්වය වන්නේ,

i) ද රයිවල්ස්, වෙදහටන, වෙල්ල වැහුම්.
ii) හැංගි හෙරා, රහස් කොමසාරිස්, ඒකට මට හිනා හිනා.
iii) පුදුම බේරිල්ල, යන්තම් ගැලවුණා, මඟුල් ප්‍රස්ථාව.
iv) සිංහබාහු, හස්තිකාන්ත මන්තරය, භව කඩතුරාව.

(26) ජවනිකා දෙකක් අතර සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට නාට්‍ය ගීතයක් යොදාගෙන ඇති අවස්ථාවකට උදාහරණයක් වන්නේ,

i) තලමල පිපිලා නාට්‍යයේ "සුමුදු නිදි කුමරි"ය.
ii) සිංහබාහු නාට්‍යයේ "වගුරට නරනිඳු..."ය.
iii) හුණුවටයේ කතාව නාට්‍යයේ "යුද්දෙට මං ගියා.."ය.
iv) තාරාවෝ ඉගිලෙති නාට්‍යයේ "තට්ටු කරන්න හෙමින්"..ය .

(27) රංගාලෝක පහන් වර්ග අතරින් ගගනිකාව ආලෝකමත් කිරීම සඳහා යොදා ගන්නා පහන් වර්ගය වන්නේ,

i) ධාරාලෝක පහනය (Flood light). ii) යොමු පහනය (Spot light).

iii) අල්ට්‍රාවයලට් පහනය (Ultra Violet). iv) තීරු පහනය (Strip light).

(28) දික්තල කාලගෝල නාට්‍යයේ දික්තලාගේ චරිතය වැඩිම කාලයක් රඟපෑ නිළිය වන්නේ,

i) තුෂාරි ගුණරත්න ය. ii) මාදිනී මල්වත්ත ය.

iii) මැණිකේ අත්තනායක ය. iv) චන්ද්‍රානි ගුණවර්ධන ය.

(29) ප්‍රාසංගික කලාවේ ලක්ෂණයක් වන්නේ,

i) අවස්ථා රූපණය කර පෙන්වීම ය. ii) අභිවාහකයෙක් සිටීම ය.

iii) වාචිකාභිනය ප්‍රධාන වීම ය. iv) ප්‍රේක්ෂක ප්‍රතිචාර අනුව සකස් වීම ය.

(30) ප්‍රොසීනියම්ආර්ක් වේදිකාවේ ඉදිරිපස අසුන් පෙළෙහි දෙකෙළවර සිටින ප්‍රේක්ෂකයාට හොඳින් පෙනෙන ලෙස මැදි වී ඇති කොටස වන්නේ,

i) ඒප්‍රණය ය. ii) ඉදිරිපස මැද ය. iii) දෘෂ්ටි රේඛාව ය. iv) ගගනිකාව ය.

(31) සිංහල ශේක්ස්පියර්, ලංකා කාලිදාස යන විරුදාවලිය ලත් නාට්‍යකරුවා අයත්වන ක්ෂේත්‍රය වන්නේ,

ı) සොකරි ය. ii) කෝලම් ය. iii) නාඩගම් ය. iv) නූර්ති ය.

(32) සංගීත ඛණ්ඩයකට හෝ කිසියම් බෙර පදයකට අනුව නළුවකු හෝ නිළියක ඇවිදීම හා චලනය කිරීමට යොදා ගන්නා චලන වර්ගය වන්නේ,

i) ස්වාභාවික. ii) තාලානුකූල. iii) නිර්මිත. iv) ප්‍රකාශනාත්මක.

(33) ඔපෙරාව තුළ ප්‍රධාන තැන ලැබෙන්නේ,

i) ගායනයට ය. ii) නර්තනයට ය. iii) රංගනයට ය. iv) මුද්‍රා භාවිතයට ය.

(34) මාර්තා ග්‍රැහැම් හා ඉසඩෝරා ඩන්කන් යනු,

i) මුද්‍ර නාට්‍යය ශිල්පිනියන්ය. ii) ඔපෙරා ශිල්පිනියන්ය.

iii) චිත්‍ර ශිල්පිනියන් ය. iv) බැලේ රංගන ශිල්පියන්ය

(35) නාට්‍ය ප්‍රේක්ෂකයා සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ,

i) ප්‍රේක්ෂකයා ප්‍රබුද්ධ රසවතෙකු විය යුතුය.

ii) නාට්‍යයේ හොඳම විනිශ්චයකරුවා ප්‍රේක්ෂකයාය.

iii) ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වේ.

iv) ප්‍රේක්ෂක ප්‍රතිචාර මත නාට්‍යය ප්‍රතිපෝෂණය වෙයි.

(36) මුද්‍රා නාට්‍ය තුළ දැකිය හැකි වන්නේ මින් කුමන ලක්ෂණයක්ද?

i) නෘත්ත ය. ii) නෘත්‍ය ය. iii) නාට්‍ය ය. iv) රූපණ ය.

(37) සිසුන් දෑස් පියා ගත් පසු, සුවඳ විලවුන් පුළුන් කැබැල්ලකට ගෙන අවකාශයේ යම් ස්ථානයක ස්ථානගත වූ පසු, පුළුන් කැබැල්ල අතැති සිසුවා සිටින ස්ථානය සුවඳ ඔස්සේ සොයා ගැනීම,

i) සංවේදන අභ්‍යාසයකි. ii) ශිථිලකරණ අභ්‍යාසයකි.

iii) පරිකල්පන අභ්‍යාසයකි. iv) තාපන අභ්‍යාසයකි.

(38) හණමිචිය (මල් මග) ලෙස හඳුන්වන ප්‍රේක්ෂාගාරයේ මැදට යා හැකි පාලමක් වැනි කුඩා වේදිකාවක් ප්‍රධාන වේදිකාවට ඉදිරිපසින් දැකිය හැක්කේ,

i) රෝම රංගභූමිය. ii) ග්ලෝබ් රංගභූමිය.

iii) ජපානයේ නෝ වේදිකාව. iv) ජපානයේ කබුකි වේදිකාව.

(39) වේදිකා නාට්‍යයේදී වර්ණ සමග කටයුතු කරනු ලබන ආනුශංගික ශිල්පියෙක් **නොවන්නේ**,

i) අංගරචනා ශිල්පියා. ii) රංගාලෝක ශිල්පියා.

iii) පසුතල නිර්මාණ ශිල්පියා. iv) සංගීත නිර්මාණ ශිල්පියා.

(40) වේශ භූෂණ, අංගරචනය, පසුතල, රංග භාණ්ඩ වැනි ආනුශංගික කලාවන් පෝෂණය කෙරෙන ප්‍රධාන කලා මාධ්‍ය වන්නේ,

i) චිත්‍ර. ii) මූර්ති. iii) කැටයම්. iv) මෝස්තර නිර්මාණ.

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව			
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය . 2025 උපකාරක ප්‍රශ්න පත්‍රය			
ශ්‍රේණිය: 11	විෂය: නාට්‍ය හා රංග කලාව	පත්‍රය: II	කාලය : පැය 02යි

සැලකිය යුතුය.

- **පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

විකෘති නාට්‍ය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) i. විකෘති නාට්‍යයේ ඉදිරිපත් කෙරෙන ඛේදවාචකය කුමක්ද? (ල-2)

ii. විකෘති නාට්‍යයේ පසුතල භාවිතය පිළිබඳ ඔබේ අදහස් දෙකක් ලියන්න (ල-2)

iii. මෙම නාට්‍යයේ එන ප්‍රධාන ගැටුම ඇති වන්නේ කවුරුන් අතරද? (ල-2)

iv. මෙම නාට්‍යයේ අවසන් දර්ශනය සිදු වන්නේ ඊට පෙර දර්ශනයෙන් වසර කීයකට පසුවද? (ල-2)

v. වේදිකා නාට්‍යක් ලෙස මෙම නාට්‍ය රචනයේ දැකගත හැකි දුර්වලතා දෙකක් ලියන්න. (ල-2)

vi. නාට්‍ය අවසානයේ වේදිකාවට පිවිසෙන පිරිස ඉල්ලා සිටින්නේ කුමක්ද? (ල-2)

(2) i. අභිරූපණ රංගනය යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? (ල-2)

ii. අභිරූපණ රංගයකදී භාවිතා කරන මූලික රංග ශිල්ප ක්‍රම දෙක ලියන්න. (ල-4)

iii. අභිරූපණ රංගයක් නිර්මාණය කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු පිළිබඳ විමසන්න. (ල-6)

(3) i. 1877 දී මෙරට ප්‍රචලිත වූ නාට්‍යය සම්ප්‍රදාය හා එම නාට්‍ය මෙරටට රැගෙන ආ විදේශිකයා නම් කරන්න. (ල-2)

ii. එම නාට්‍ය සම්ප්‍රදායේ ජනප්‍රියම නාට්‍යකරුවන් දෙදෙනෙකු හා ඔවුන්ගේ නිර්මාණ දෙකක් ලියන්න. (ල-4)

iii. එම නාට්‍ය ශෛලියේ විශේෂ ලක්ෂණ දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට බලපෑ අයුරු පැහැදිලි කරන්න. (ල-6)

(4) i. වර්තමාන සමාජයේ වඩාත් දක්නට ලැබෙන මඩු ශාන්ති කර්ම දෙකක් නම් කරන්න. (ල-2)

ii. ඉහත නම් කරන ලද ශාන්ති කර්ම දෙකෙන් එකක අන්තර්ගත නාට්‍යමය පෙළපාලි හතරක් නම් කරන්න. (ල-4)

iii. ඉහත (ii) හි සඳහන් නාට්‍යමය පෙළපාලියක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ උදාහරණ සහිතව විමසන්න. (ල-6)

(5) i. නාට්‍ය පෙළකට ගැලපෙන ලෙස නළු නිළියන් තෝරා ගැනීම හඳුන්වන්නේ කුමන නමකින්ද? (ල-2)

ii. නාට්‍ය පෙළෙහි රංගනය වඩාත් අර්ථවත් කිරීමට යොදාගත හැකි කරුණු දෙකක් ලියන්න. (ල-4)

iii. ඉහත (ii) සඳහන් කරුණු නාට්‍ය නිෂ්පාදනයේදී භාවිතා කරන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල-6)

(6) i. වේදිකාව, සිනමාව, රූපවාහිනිය යන අංශ තුනෙහිම රංගනයෙන් දායක වූ රංග ශිල්පීන් දෙදෙනෙකු හෝ ශිල්පිනියන් දෙදෙනකු නම් කරන්න. (ල-2)

ii. ඔවුන් රංගනයෙන් දායක වූ නාට්‍ය නිර්මාණ දෙක බැගින් ලියන්න. (ල-4)

iii. ඉහත (i) හි නම් කරන ලද ශිල්පිනීන් හෝ ශිල්පීන්ගේ නිර්මාණ හා රංග කුසලතා පිළිබඳ උදාහරණ දක්වමින් ඇගයීමට ලක් කරන්න. (ල-6)

(7) පහත දැක්වෙන සිදුවීම ඇසුරෙන් ඒකාංක නාට්‍යයකට සුදුසු නාට්‍ය පෙළක් රචනා කරන්න.

පසුගිය වෙසක් පොහොය දා රන්දික ඇතුළු පවුලේ සැම බෙල්ලන්විල රජමහා විහාරයට ගොස් වැඳපුදා හමාර කොට, ඉන්පසු බෞද්ධාලෝක වෙසක් කලාපය නැරඹීමට ගියහ. එහිදී මහා පහන් කූඩු, තොරණ,දන්සැල් ආදිය එකිනෙක දැක බලාගෙන රැස්ව සිටි විශාල පිරිස අතරින් ඉදිරියට ගමන් ගන්නාවිට එකවරටම ඔහු දුටුවේ ඔහු නැරඹූ ආලවක දමනය නිමිති කොටගෙන තනා තිබූ මහා පහන් කූඩුවේ අසලින් සිටි කඩුවක් අතින් ගත් ආලවක යක්ෂයා කඩුවත් අමෝරාගෙන තමන් සිටින දිශාවට දිව එන බවයි.... තැතිගත් රන්දික....

i. පසුබිම, කාලය, සිදුවීම හා චරිත මැවීම සඳහා අවශ්‍ය පරිදි රංග විධාන සංවාද රචනා කිරීමට (ල-4)

ii. ගැටුමක් ඇතිවන පරිදි අවස්ථා ගොඩනැගීම. (ල-4)

iii. කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම. (ල-4)

නාට්‍ය හා රංග කලාව

පිළිතුරු පත්‍රය

I පත්‍රය

01.	4	11.	2	21.	2	31.	4
02.	2	12.	2	22.	4	32.	2
03.	1	13.	3	23.	1	33.	1
04.	2	14.	2	24.	3	34.	4
05.	1	15.	2	25.	3	35.	4
06.	3	16.	2	26.	1	36.	2
07.	2	17.	3	27.	2	37.	1
08.	3	18.	4	28.	3	38.	4
09.	2	19.	1	29.	2	39.	4
10.	2	20.	3	30.	3	40.	1

II පත්‍රය

01. සමාජීය හා ආර්ථික වෙනස සමඟ අධ්‍යාපනික රාමුව දැඩි විපර්යාසයන්ට භාජනය වූ සමයක දරුවන්ගේ අපේක්ෂා හා වැඩිහිටියන්ගේ අපේක්ෂා අතර ඇතිවන ගැටුම හා අවසානයේ ඔවුනොවුන්ගේ ජීවිතවල බෙදවාචකය විකෘති නාට්‍යයෙන් පැහැදිලි කරයි.

i. සුදුසු ආකාරයේ පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න-

ii. ප්‍රියංගනී හා හිල්ඩා අතර

iii. වසර 7කට පසුව-

iv. කෙටි දර්ශන බහුල වීමත

9 වැනි දර්ශනයට පසු වසර හතකින් පසු සිද්ධියකින් දහවෙනි දර්ශනය තිබීම.

කේන්ද්‍රීය කතා පුවත අදාල නැති අවස්ථා නිරූපණ දක්නට ලැබීම.

උදා= ශාස්ත්‍රකරු, ටියුෂන් පොළ ආදිය

v. කෑමට බීමට ඇඳුම පැළඳුමට ගෙයට දොරට යාන වාහනයට තරගයක් නැති ලොවක් ළඟා කර දෙන්න ගුරුනි දෙගුරුනි අපට ල

02. i. ආංගික අභිනය මූලික කරගෙන වාචික අභිනයෙන් තොරව යම්කිසි සිද්ධියක් හෝ ක්‍රියාකාරකමක් නිර්මාණශීලීව රඟ දක්වා පෙන්වීමයි -

ii. බාහිර ශිල්ප ක්‍රම / අභ්‍යන්තර ශිල්ප ක්‍රම-

iii. මිනිස් සිරුර භාවිතය තුළින් විවිධ දේ මවා පෑමට හැකි ආකාරයේ අවස්ථාවන් හා සිදුවීම් තෝරාගත යුතුය-

- තෝරාගන්නා සිද්ධිය නාට්‍යමය ගුණයෙන් යුක්තව ගොඩනගා ගත යුතුය-
- අංග රචනයේදී චරිතයක් මතුවන ආකාරයට මුහුණේ උපාංග වඩාත් ඉස්මතු වන අන්දමට සුවිශේෂී ලෙස අංගරචනය කළ යුතුය-
- යොදා ගන්නා ඇඳුම්වල ස්වභාවයද ශිල්පියා වඩාත් කැපී පෙනීමට හේතුවන අයුරින් යොදාගත යුතුය-
- ශරීරාංග මැනවින් ඉස්මතු වන අයුරින් ඇඳුම් භාවිතා කරයි-
- රංගනය වඩා තීවු කිරීමට හා අර්ථවත් කිරීමට ශබ්ද හා නාදය භාවිතා කරයි-
- සීමිත අවකාශයක් තුළ නරඹන ප්‍රේක්ෂකයාට විවිධ රසභාව හා අර්ථ ජනනය වන සේ සමස්ථ රංගය ගොඩනගා ගැනීම සිදු කළ යුතුය-

03. i. නූර්ති නාට්‍යය බලිවාලා

ii. ජෝන්දසිල්වා රාමායනය, සිරි සඟ බෝ, දස්කොන්, දුටුගැමුණු, නල රාජ චරිතය, ශ්‍රී වික්‍රම ආදී නාට්‍ය-

චාල්ස් ඩයස් පණ්ඩුකාභය, නාගානන්ද, කුස ජාතකය, පදමාවතී-

iii. පිටපත/ සංගීතය/ විචිත්‍රවත් චිත්‍ර වස්ත්‍ර/ වෙස් මෝස්තර/ රංග භූමි අලංකරණ/ නාට්‍යෝපකරණ/ ආදී නූර්ති නාට්‍ය ලක්ෂණ දක්වා එය නූතන නාට්‍යය සඳහා භාවිත කර ඇති ආකාරය උදාහරණ

04 i. දෙවොල්මඩු /ගම්මඩු-

ii. අඹ විදමන, මරා ඉපැද්දවීම, රාමා මැරීම, දෙවොල් ගොඩ බැසීම, ඇත් බන්ධන හා මී බන්ධනය, ඉහත එක් නාට්‍යමය පෙළපාළියක් අනුකරණය, අනුරූපණය, සමාරෝපය, අවස්ථා නිරූපණය, සංවාද භාවිතය, රංග භාණ්ඩ භාවිතය, රංග භූමි භාවිතය, ප්‍රේක්ෂක සහභාගිත්වය, ආදී නාට්‍යමය ලක්ෂණ ඇතුළත් කොට උදාහරණ සහිතව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න-

05. i. නළුවරණය-

ii. වේශ භූෂණ/ අංගරචනය-

iii. වේදිකා නාට්‍යවල උදාහරණ දක්වමින් එය සාර්ථක කර ගැනීමට ඉහත කරුණු දෙක බලපා ඇති ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න-

06. i. ශිල්පීන් නීල් අලස්, සුමින්ද සිරිසේන ,ජයලත් මනෝරත්න ,හෙන්රි ජයසේන, ජැක්සන් ඇන්තනී, විජය නන්දසිරි, ශ්‍රියන්ත මෙන්ඩිස්-

ශිල්පිණියන් රත්නා ලාලනී ජයකොඩි, මැණිකේ අත්තනායක, රම්‍යා වනිගසේකර, දීපානි සිල්වා, චාන්දනී සෙනවිරත්න, කෞශල්‍යා ප්‍රනාන්දු-

ii. අපේක්ෂකයා නම් කළ ශිල්පීන් /ශිල්පිනියන් රඟපාන ලද නාට්‍ය නිර්මාණ දෙක බැගින් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න -

iii. (1) සඳහන් ශිල්පීන්/ ශිල්පිණියන් රංගනයෙන් දායක වූ නාට්‍ය චරිත වල ස්වභාවය, චරිත නිරූපණයේදී ප්‍රකටවන දක්ෂතා ,හැකියාවන් ,ආදිය උදාහරණ දක්වමින් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න-

07. අදාළ පරිදි නාට්‍යපෙළ රචනා කර ඇත්නම් දකුණු ලබා දෙන්න-